සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# පළමුවාර අවසාන ඇගයීම
# First term End Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගයේ ආරම්භය දක්වා කාලයේ ලියවුණු බොහෝ කෘතිවල ප්‍රධාන අරමුණ වූයේ,

(1) දේශපාලන තොරතුරු ඉදිරිපත් කිරීම ය.
(2) රජවරුන් පිළිබඳ වර්ණනා කිරීම ය.
(3) ආගමික තොරතුරු ඉදිරිපත් කිරීම ය.
(4) රටේ ආර්ථික සෞභාග්‍යය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ය.

(02) පැරණි කාන්තාවන්ගේ විලාසිතා පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරන්නෙකුට වඩාත් වැදගත් මූලාශ්‍රය කුමක් ද?

(1) සීගිරි චිත්‍ර (2) පැරණි කාසි
(3) දඹුලු විහාරයේ චිත්‍ර (4) සීගිරි කුරුටු ගී

(03) වසර 80,000කට පමණ පෙර ජීවත්වූ ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිත කළ ශිලා මෙවලම් හමුවී ඇත්තේ,

(1) කිතුල්ගල බෙලිලෙනෙනි. (2) බුන්දල වැල්ලෙගංගොඩිනි.
(3) සීගිරිය අලිගලිනි. (4) හම්බන්තොට පතිරාජවෙලෙනි.

(04) අතීත ජනතාව ගම්මානවල ජීවත්වීම ආරම්භ වූයේ කුමන යුගයේ ද?

(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ (2) පූර්ව ඓතිහාසික යුගයේ
(3) මුල් ඓතිහාසික යුගයේ (4) පොළොන්නරු යුගයේ

(05) ගංගාවක පිටාර තැන්නෙන් පිටත ජීවත්වූ ජනතාවගේ ප්‍රධාන යැපීම් මාර්ගය වූයේ,

(1) වී ගොවිතැනයි. (2) එළවළු වගාවයි.
(3) සත්ත්ව පාලනයයි. (4) හේන් ගොවිතැනයි.

(06) පැරණි සමාජය තුළ සෑම පවුලක ම ප්‍රධානියා හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

(1) ගෘහපති (2) ගෘහමූලික (3) ගමික (4) පරුමක

(07) පරුමකවරයකු බිහිවීම ආරම්භ වූයේ,

(1) පවුල ප්‍රධාන කොටගත් සමාජයක් බිහිවීම නිසා ය.

(2) ගම් වැව් ආරම්භවීමත් සමග ය.

(3) රජුට සහාය වීම සඳහා ය.

(4) වැව් පද්ධතිය නඩත්තු කිරීම සඳහා ය.

(08) - ලම්බකර්ණ රාජ වංශයේ ආරම්භකයා වීම.

- විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම ආරම්භ කිරීම.

- රජයේ බදු ප්‍රතිපත්තිය විධිමත් කිරීම.

ඉහත තොරතුරු හා සම්බන්ධ රජතුමාගේ නම කුමක් ද?

(1) පළමුවන විජයබාහු (2) මහසෙන් (3) වසභ (4) ධාතුසේන

(09) පහත "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. භෝජනශාලා අධිකාරි | A. රූප අදෙක |
| 2. චාරිත්‍ර පිළිබඳ අධිකාරි | B. බතගු |
| 3. කාසි අච්චු ගැසීමේ ප්‍රධානි | C. කන පෙඩික |
| 4. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි | D. කොතුරු ගෑ නා |

(1) BDAC (2) DBAC (3) BCAD (4) DCBA

(10) ක්‍රි.ව. 9වන සියවසේ දී ලියවුණු සෙල්ලිපිවල "සභාව" නමින් හඳුන්වා ඇත්තේ,

(1) පරිපාලන සංවිධානයයි. (2) අධිකරණයයි

(3) රාජ සභාවයි. (4) නිලධාරී මණ්ඩලයයි.

(11) පහත "අ" හා "ආ" තීර යටතේ දැක්වෙන තොරතුරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. සොත්ථිසාලා | A. මාතෘ නිවාස |
| 2. පසවන්ති නාමසාලා | B. භික්ෂූන්ගේ වාසස්ථාන |
| 3. සිවිකාසාලා | C. ශිව ලිංග පිහිටි ස්ථාන |
| 4. පණ්ණසාලා | D. බ්‍රාහ්මණයින්ගේ ආගමික ස්ථාන |

(1) DABC (2) DCBA (3) CDAD (4) DACB

(12) දහනයට ඔක්සිජන් භාවිත කිරීම අපේ පැරන්නන් සිදුකර ඇත්තේ,

(1) ක්‍රි.ව. 1350 දී පමණ ය. (2) ක්‍රි.පූ. 2400 දී ය.

(3) ක්‍රි.පූ. 1350 දී පමණ ය. (4) ක්‍රි.ව. 450 දී ය.

(13) සැතපුම් හතක් පමණ දිග කෘත්‍රිම වැව් බැම්මක් දක්නට ලැබෙන්නේ,

(1) කලා වැවේ ය. (2) හුරුලු වැවේ ය.

(3) තිසා වැවේ ය. (4) යෝධ වැවේ ය.

(14) ඇළහැර ඇළෙන් ජලය ලබා නොගන්නා වැව මින් කුමක් ද?
(1) මින්නේරි වැව (2) මාගල්ල වැව
(3) ගිරිතලේ වැව (4) කවුඩුල්ල වැව

(15) රුවන්වැලි සෑයේ පාදමට අතුරවනු ලැබූ ලෝහ දැලට තවරන ලද ද්‍රව්‍ය කුමක් ද?
(1) රන් ලෝහය (2) වෙඬරු මැටි (3) දිවුල් මැලියම් (4) කපු මැලියම්

(16) ජනතාවගේ සනීපාරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් රෝහල් දහ අටක් ඉදිකළ බව වංසකතාවල පෙන්වන්නේ කුමන රජතුමා ද?
(1) මහා පරාක්‍රමබාහු (2) බුද්ධදාස (3) පස්වන මිහිඳු (4) දුටුගැමුණු

(17) සෙල්ලිපිවල දණ්ඩනායක වශයෙන් හඳුන්වා ඇත්තේ,
(1) ආරක්ෂක නිලධාරීන් ය. (2) විනිශ්වයකාරවරුන් ය.
(3) ප්‍රාදේශීය පාලකයන් ය. (4) අධිකරණ නිලධාරීන් ය.

(18) විනිමය කටයුතුවල දී ලෝහ බර වටිනාකමක් සේ භාවිත වූ බවට සාක්ෂි ලැබෙන්නේ,
(1) ජේතවන විහාරයෙනි. (2) මහාවිහාරයෙනි.
(3) ආලාහන පිරිවෙනෙනි. (4) අභයගිරි විහාරයෙනි.

(19) අනුරාධපුර කොක්ඇබේ සෙල්ලිපියෙන් හෙළිවන කරුණක් වන්නේ,
(1) කාන්තාවන් පරුමක වරියන් වශයෙන් කටයුතු කිරීම ය.
(2) චූලසීවලී නමින් හැඳින්වූ රැජිණක් පිළිබඳව ය.
(3) කාන්තාවන් තම ධනය යොදවා ශාසනික කටයුතු කිරීම ය.
(4) සූප ශාස්ත්‍රයේ නිපුණ කාන්තාවන් පිළිබඳව ය.

(20) - යාපහුව තම අගනුවර වශයෙන් තෝරා ගැනීම.
- ඊජිප්තුවේ සුල්තාන්වරු සමග සබඳතා පැවැත්වීම.
- කාලිංගරායරගේ ආක්‍රමණයට සාර්ථකව මුහුණදීම.
ඉහත තොරතුරු හා සම්බන්ධ පාලකයා කවුරුන් ද?
(1) පළමුවන බුවනෙකබාහු රජු (2) දෙවන බුවනෙකබාහු රජු
(3) තෙවන පරාක්‍රමබාහු රජු (4) සිව්වන පරාක්‍රමබාහු රජු

(21) මලය රටට අයත් ප්‍රදේශ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මහනුවර - ගම්පොළ (2) පඬුවස්නුවර - දඹදෙණිය
(3) සීතාවක - රයිගම (4) කුරුණෑගල - කෝට්ටේ

(22) පහත දක්වා ඇති සාහිත්‍ය ග්‍රන්ථ හා ඒවා රචනා වූ යුග අතුරින් නොගැළපෙන පිළිතුර කුමක් ද?
(1) සිදත් සඟරාව - දඹදෙණිය (2) දළදා සිරිත - කුරුණෑගල
(3) සද්ධර්මාලංකාරය - ගම්පළ (4) මයුර සංදේශය - කෝට්ටේ

(23) දෙවන විමලධර්මසූරිය රජු මෙරටට උපසම්පදාව ගෙන ඒමට පියවර ගත්තේ,
(1) සියමෙනි (2) බුරුමයෙනි
(3) මලයාසියාවෙනි (4) ඉන්දියාවෙනි

(24) මහනුවර යුගයේ දී රටවසම නමින් හැඳින්වූයේ,
(1) මහවාසල කටයුතු භාර සංවිධානයයි. (2) බදු එකතු කරන සංවිධානයයි.
(3) ප්‍රාදේශීය පාලන සංවිධානයයි. (4) රටේ ආරක්ෂක සංවිධානයයි.

(25) කෝට්ටේ වැසියන් හා පෘතුගීසීන් අතර වර්ෂ 1562 දී සටනක් සිදුවූයේ,
(1) රන්දෙනිවෙල ය. (2) මුල්ලේරියාවේදී ය.
(3) ගන්නෝරුවේ ය. (4) දන්තුරේ ය.

(26) - රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලය.
- ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම.
- ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම.
ඉහත කරුණු හේතු කොටගෙන බිඳවැටුණු රාජධානිය කුමක් ද?
(1) කෝට්ටේ (2) දඹදෙණිය (3) ගම්පොළ (4) යාපනය

(27) රාජකීය බලපත්‍රයක් ලබාගත් පෙරදිග බ්‍රිතාන්‍ය වෙළඳ සමාගම ප්‍රථමයෙන් වෙළඳ කටයුතු කළේ"
(1) ඇම්බොයිනා දූපතේ ය. (2) ජාවා දූපතේ ය.
(3) ඉන්දියාවේ ය. (4) සුමාත්‍රා දූපතේ ය.

(28) පහත සඳහන් තොරතුරු ඓතිහාසික අනුපිළිවෙලට පෙළගැස්සූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
A - ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීම
B - මියුරන් කොමිසම පත්කිරීම
C - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
D - ෆන් එංගල් බෙක්ට කියුලිපිය ලැබීම
(1) DBCA (2) DCAB (3) DBAC (4) CDBA

(29) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන්ගේ ග්‍රහණයට ගොදුරුවීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ,
(1) රජු ආරක්ෂාව පිළිබඳ නොසලකා සිටීමයි.
(2) ඉංග්‍රීසීන්ගේ උපක්‍රමශීලී ක්‍රියාමාර්ගයි.
(3) උඩරට මහජනතාව රජුට එරෙහිවීමයි.
(4) රජු කැමැත්තෙන් යටත්වීමයි.

(30) තමා සමඟ සිටි ඉංග්‍රීසි හමුදාව ආපසු යවා වෙල්ලස්සේ සටන්කාමීන් සමඟ එකතු වූ උඩරට රදළවරයා කවුරුන් ද?
(1) පිළිමතලව්වේ (2) කැප්පෙටිපොළ (3) මඩුගල්ලේ (4) ඇහැළේපොළ

(31) අපේ රටේ අතීත උරුමය ගවේෂණ හා පර්යේෂණ මගින් එළි දැක්වූ යුරෝපීයන් දෙදෙනකුගේ නම් සඳහන් පිළිතුර කුමක් ද?
(1) රිස් ඩේවිඩ් හා බ්‍රෝහියර් (2) හෙන්රි පාකර් හා එච්.සී.පී.බෙල්
(3) ජෝර්ජ් ටර්නර් හා ස්පිටල් (4) රොබට් නොක්ස් හා බ්‍රෝහියර්

(32) ද්‍රවිඩ ජනතාව දැනුවත් කිරීම සඳහා "උදයභානු" පුවත්පත ආරම්භ කළේ,
(1) ටී.බී. ජයා මහතා ය. (2) අරුමුග නාවලර්තුමා ය.
(3) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (4) සිද්දි ලෙබ්බේතුමා ය.

(33) යුරෝපීය පුනරුදයේ ආරම්භය සිදුවූයේ ඉතාලියේ

(1) රෝම නගරයේ ය. (2) ජිනෝවෝ නගරයේ ය.

(3) ප්ලෝරන්ස් නගරයේ ය. (4) වෙනිසි නගරයේ ය.

(34) දේශ ගවේෂණ ව්‍යාපාරයේ දී සොයාගත් ප්‍රදේශ හා ඒවාට දායකවූ පුද්ගලයන් පහත අ. ආ, තීරුවල දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. සුබ පැත්මේ තුඩුව | A. බර්තලමියුඩයස් |
| 2. කැලිකට් | B. ක්‍රිස්ටෝපර් කොලොම්බස් |
| 3. පිලිපීනය | C. වස්කෝ ද ගාමා |
| 4. බටහිර ඉන්දියානු දූපත් | D. මැගලන් |

(1) ADCB (2) BCDA (3) DCBA (4) ACDB

(35) පුනරුද සමයේ දී ඖෂධ විද්‍යාව හා රෝග චිකිත්සාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුද්ගලයා කවුරුන් ද?

(1) විලියම් හාවේ (2) මයිකල් සර්ටෙස්

(3) පැරසල්සස් (4) ලුවී පාස්චර්

පහත තොරතුරු අධ්‍යයනය කොට 36, 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලැබීම
B - කුරුඳු වගාව ආරම්භ කිරීම
C - රෙපරමාදු ආගම ලැබීම
D - නව නිලධාරි පන්තියක් ලැබීම
E - කපිරිඤ්ඤා සංගීතය ලැබීම

(36) පුනරුදයේ බලපෑම් ලෙස අපේ රටට ලැබුනු ඉහත දෑ අතුරින් ලන්දේසින්ගේ බලපෑමෙන් ලැබුන දේ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) C හා E (2) A හා B (3) D හා E (4) B හා C

(37) ඉංග්‍රීසීන්ගේ බලපෑමෙන් ලද දේ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා D (2) A හා E (3) B හා C (4) A හා B

(38) යපස් උණු කිරීමට නව විදුලි උදුනක් සකස් කරන ලද්දේ

(1) හෙන්රි බෙස්මර් ය. (2) හෙන්රි කෝට් ය.

(3) විලියම් සීමන්ස් ය. (4) ඒබ්‍රහම් ඩර්බිය.

(39) කාර්මික විප්ලවය නිසා සිදුවූ කෘෂිකාර්මික දියුණුවත් සමඟ රොබට් බැක්වෙල් හඳුන්වා දෙන ලද්දේ,

(1) ශෂ්‍ය මාරු ක්‍රමයයි. (2) පේළි වැපිරීමේ ක්‍රමයයි.

(3) බැටලු වර්ග අභිජනනයයි. (4) ගුවානෝ පොහොර නිෂ්පාදනයයි.

(40) එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා විසින් ලංකාවේ ඉදිකරන ලද ප්‍රථම මහා මාර්ගය වූයේ,

(1) කොළඹ - මහනුවර මාර්ගයයි. (2) මහනුවර - කුරුණෑගල මාර්ගයයි.

(3) මහනුවර - දඹුල්ල මාර්ගයයි. (4) මහනුවර - බදුල්ල මාර්ගයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමුවාර අවසාන ඇගයීම
First term End Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කිරිඳි ඔය, පාහියන්ගල, ජම්බුකෝල පට්ටන, සීගිරිය, ගම්පොළ, මඩකලපුව, සල්වතොට, යටිගල්පොත්ත, පොළොන්නරුව, හුරුළු වැව, කලාඔය, පුනරීන් (ලකුණු 12)

(ii) ඉන්දියාව, ජපානය, ඉතාලිය, ගෝව, ජාවා දූපත, බෙංගාල බොක්ක (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ක්‍රි.ව. 1730 දී ගල් අඟුරු යොදා යපස් උණු කිරීමේ ක්‍රමය සොයාගැනීම

B - බෞද්ධ පුනරුද සමයේ අනුරාධපුරයේ බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමේ ව්‍යාපාරයේ ආරම්භකයා

C - දන්තුරේ සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන්වරයා

D - කෝට්ටේ බලකොටුවක් සැදූ ඇමතිවරයා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



A රූපය

(ii) (1) A රූපයෙන් දැක්වෙන පූජනීය ස්ථානය කුමක් ද?
(2) මෙම නිර්මාණය කරවා ඇත්තේ කවුරුන් විසින් ද?
(3) මෙහි තැන්පත් කර ඇති පූජනීය වස්තුව කුමක් ද?
(4) මෙහි ඇති ගල් කණු කුමන ගොඩනැගිල්ලක නටබුන් ද? (ලකුණු 04)



B රූපය

(iii) (1) B පින්තූරයේ තිබෙන ගොඩනැගිල්ල නම් කරන්න.
(2) එය පිහිටා ඇති රට කුමක් ද?
(3) ශ්‍රී ලංකාවට එවීම සඳහා මෙහි සිට ලිපියක් ලියූ ඕලන්ද පාලකයා නම් කරන්න.
(4) එම ලිපිය ලැබෙන විට ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයාගේ නම ලියන්න. (ලකුණු 04)

## II කොටස

(02) (i) පරුමකවරුන් ලෙස සිට දුටුගැමුණු රජුගේ සෙන්පතිවරු බවට පත්වූ තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) දේවානම්පියතිස්ස රජු ප්‍රාදේශීය පාලකයින් සමඟ සුහදශීලීව කටයුතු කළ බවට කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පණ්ඩුකාභය රජුගේ දේශපාලන සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) I වන විජයබාහු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) සෙල්ලිපිවල A. කුබකර B. කබර C. තුලාධර වශයෙන් හඳුන්වා ඇත්තේ කුමන පුද්ගලයින්දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C, D වලින් දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A. බුද්ධඝෝෂ හිමියන් අධ්‍යයන කටයුතු කළ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානය

B. දීඝ නිකාය මතකයේ තබාගත් භික්ෂූන් හැඳින්වූ නම

C. දකුණු ඉන්දියානු කුලී හේවායින්ගේ සහාය පැතූ ප්‍රථම ලාංකික පාලකයා

D. ගමේ සැඟවුනු අපරාධකරු අල්ලා ගන්නා තුරු ගම්වැසියන් රජයට ගෙවිය යුතු බද්ද (ලකුණු 04)

(iii) පැරණි සමාජය තුළ සංවිධානාත්මක දේශීය වෙළඳාමක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පැරණි පාලකයින් මෙන් ම ජනතාව ද මෙරට තුළ වාර්ගික සහජීවනයෙන් කටයුතු කළ බව උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) මහනුවර රජධානියේ මුල් පාලකයින් තිදෙනා අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

(ii) උඩරට රජු විසින් විසඳූ නඩුවර්ග හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) මහනුවර සමාජ සංවිධානය තුළ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුදු දහමේ දියුණුව සඳහා කරන ලද සේවාවන් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පොළොන්නරුව බිඳවැටීමෙන් පසු ආරක්ෂිත ස්ථානවල පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නිරිතදිග නව රාජධානි සමයේ ආර්ථිකය තුළ පැවති ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්වීමට බලපෑ කරුණු තුනක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) ක්‍රි.ව. 1796ට පෙර උඩරටට පැමිණි බ්‍රිතාන්‍ය දූතයින් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) මුහුදුබඩ ප්‍රදේශ පාලනය සඳහා ඉංග්‍රීසි වෙළඳ සමාගම අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍ය යටත් කරගැනීමේ අවශ්‍යතාවය ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ක්‍රි.ව. 1848 නිදහස් අරගලයට කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම සිදුවූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) කිතු දහම පැතිරවීම සඳහා මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - බුලත්ගම ධම්මාලංකාර හිමියන් විසින් ගාල්ලේ පිහිටවූ මෙරට ප්‍රථම මුද්‍රණාලය

B - පරමධම්මචේතිය පිරිවෙන පිහිටුවීමට මූලිකව කටයුතු කළ භික්ෂූන් වහන්සේ

C - ඉස්ලාම් පුනරුද ව්‍යාපාරය සාර්ථක කරගැනීම සඳහා ඊජිප්තුවේ සිට මෙරටට පැමිණි පුද්ගලයා

D - ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබූ පානදුරවාදය මෙහෙයවූ භික්ෂූන් වහන්සේ

(ලකුණු 04)

(iii) ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් මෙරට සිදුවූ බෞද්ධ පුනරුදය කරුණු දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුස්ලිම් ජනතාව ඉස්ලාම් ආගමික පුනරුදය වෙනුවෙන් කටයුතු කළ ආකාරය කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) කාර්මික විප්ලවයේ බලපෑමත් සමඟ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට එකතු වූ නිර්මාණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දේශපාලන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කිරීමට කාර්මික විප්ලවය බලපෑ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවයේ යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵලද දැකිය හැකි බව කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ විශිෂ්ඨ සාහිත්‍ය සේවාවක් කළ ඉතාලි ජාතික ගත් කතුවරු තිදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයින්ගේ නම් අනුපිළිවෙළින් ලියන්න.

A - මුද්‍රණ යන්ත්‍රය B - මොනාලිසා චිත්‍රය

C - පියෙටා ප්‍රතිමාව D - දුරදක්නය (ලකුණු 04)

(iii) පුනරුදයත් සමඟ කලා ශිල්ප ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපා පුනරුදයේ බලපෑම මත ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා

